# 13 සදාචාරවත් වෙමු අපි

අප ජීවත් වන්නේ තනි තනි පුද්ගලයන් වශයෙන් නොව සමාජයක සාමාජිකයන් හැටියට ය. සමාජයක සාමාජිකයන් හැටියට ජීවත් වන විට අප කරන කියන දේ සමාජයටත් සමාජයේ අනෙක් සාමාජිකයන් කරන කියන දේ අපටත් නිසැකව ම බලපාන බව අපි දනිමු. අනෙක් සාමාජිකයන්ගේ ක්‍රියා කලාපය අපට අහිතකර ලෙස බලපාන්නේ නම් අපි ඊට අකැමැති වෙමු. අපගේ ක්‍රියාකලාපය අනෙක් අයට බලපාන්නේ ද අහිතකර ලෙස නම් ඔවුහු ද ඊට අකැමැති වෙති. සමාජයක සාමාජිකයන් ලෙස ජීවත් වන විට අපේ ක්‍රියා කලාපය ගැන වැඩි අවධානයක් යොමු කිරීමට පෙර සිට ම අප පෙලඹී ඇත්තේ එබැවිනි.

> තමන්ටත් අනුන්ටත් අහිතකර වන්නේ පව්ටු සිතින් කරන නරක දේ ය, වැරදි දේ ය, නො කළ යුතු දේ ය. හිතකර වන්නේ ප්‍රසන්න සිතින් කරන හොඳ දේ ය, හරි දේ ය, කළ යුතු දේ ය.

හරි වැරදි, හොඳනරක, කළයුත්ත නො කළයුත්ත තීරණය කරනු ලබන්නේ සමාජ සාමාජිකයන් විසින් ය. විශේෂයෙන් අනෙකුත් අයට වඩා කරුණු වැටහෙන සාමාජිකයන් විසින් ය. බුදු දහමෙහි එබඳු අය හැඳින්වෙන්නේ විඤ්ඤූ පුද්ගලයන් ලෙස ය. ඔවුන්ගේ මග පෙන්වීමෙන් ගොඩ නංවන ලද, පුද්ගලයාටත් සමාජයටත් හිතකර ආචාර ධර්ම, සිරිත් විරිත්, සමාජ සම්මුති සුරකින සමාජය සදාචාර සම්පන්න ලෙසත් ඒවා කඩ කරන, ඒවා ඉක්මවා යන සමාජය දුරාචාරවත් ලෙසත් පිළිගැනේ.

> බුදු දහම අනුව මනුෂ්‍ය ධර්මය, මිනිස් ගුණ දහම් සුරකෙන සමාජය සදාචාර සම්පන්න ය. මනුෂ්‍ය ධර්මය ඉක්මවා යන, මිනිස් ගුණ දහම් කඩ කරන සමාජය දුරාචාරවත් ය.

සදාචාරය නම් යහපත් හැසිරීමයි. එයට පටහැනි හැසිරීම් දුරාචාරය වේ. සදාචාර යන්නට බුදු දහමේ සඳහන් වන වචන අතර ඉතා සමීප වචනය **ධම්මචරියා** යන්නයි. **සමචරියා** යන්න ද ඒ සමග යෙදේ. දුරාචාරය වෙනුවට **අධම්මචරියා, විසමචරියා** යන වචන භාවිත කෙරේ.

බුද්ධ වචනයට අනුව ධම්මචරියා හෙවත් සමචරියා නම් දස කුසල් ය. අධම්මචරියා, විසමචරියා ලෙස හැඳින්වෙන්නේ දස අකුසල් ය.

දස කුසල නම් දස අකුසල්වලින් වැළකීමයි. පහත සඳහන් වන්නේ එම දස කුසල් ය.

- ජීවීන් විනාශ කිරීමෙන් වැළකීම
- සොරකමින් වැළකීම
- ලිංගික අනාචාරයෙන් වැළකීම
- බොරු කීමෙන් වැළකීම
- කේලම් කීමෙන් වැළකීම
- රළු එරුස වචනවලින් වැළකීම
- නිරර්ථක වචන කීමෙන් වැළකීම
- දැඩි ලෝභයෙන් වැළකීම
- වෛර සහගත තරහ සහගත සිතිවිලිවලින් වැළකීම
- මිථ්‍යා දෘෂ්ටියෙන් හෙවත් වැරදි පිළිගැනීම්වලින් වැළකීම

සදාචාරවත් සමාජයක ජීවිත හානි සිදු නො වේ. මිනිසුන්ගේ පමණක් නොව අනෙකුත් ජීවීන්ගේ ද ජීවිත සුරක්ෂිතතාව තිබීම සදාචාරවත් සමාජයක ලක්ෂණ වේ. එහි සොරකම් නැති නිසා දේපොළ ද සුරක්ෂිත ය. අඹුසැමියන් ජීවත් වන්නේ අන්‍යෝන්‍ය විශ්වාසයෙන් හා සමගියෙන් යුක්ත ව ය. වචනය භාවිත කර අනුන් රැවටීම්, මුළා කිරීම්, ඔවුනොවුන් බිඳවීම්, අසමගි කිරීම්, සිත් රිදවීම්, වෙනුවට එහි ඇත්තේ සත්‍යය පැහැදිලි කර දෙන, අසමගි වූවන් සමගි කරන, කනට ප්‍රිය මනාප උපදවන වචන භාවිත කරන පරිසරයකි.

තම සන්තකයෙන් සෑහීමට පත් නොවී අන් සන්තකයට පවා ආශා කරන, නිතර ම ද්වේෂ සහගත, වෛර සහගත සිතිවිලිවලින් පිරුණු කර්ම, කර්ම විපාක, හොඳ නරක නොපිළිගන්නා අයගෙන් සදාචාරයක් බලාපොරොත්තු විය හැකි නො වේ. අසීමිත ආශාවන්ගෙන් තොර, මෙත් සිතිවිලිවලින් බර, හොඳ නරක, මෙලොව පරලොව, පව්, පින් විශ්වාස කරන අයගෙනි, සදාචාර සම්පන්න සමාජයක් ගොඩ නැඟෙන්නේ. මේ අනුව බලන විට පැහැදිලි වන්නේ ධම්මචරියාවෙහි යෙදෙන සමාජය, දස කුසල දහම්හි හෙවත් මනුෂ්‍ය ධර්මයෙහි පිහිටි සමාජය, සදාචාර සම්පන්න වන බවයි. වෙනත් ලෙසකින් දක්වතොත් සීලවන්ත සමාජය සදාචාර සම්පන්න වන බව ය.

ජීවිත විනාශ කිරීමෙන් වැළකීම, සොරකම් කිරීමෙන් වැළකීම, ලිංගික අනාචාරයෙන් වැළකීම, බොරු කීම්, කේලම් කීම් ආදියෙන් වැළකීම යනු සිල්වත්කමින් යුක්ත වීමයි. සත්ත්ව දයාවෙන් යුක්ත වීම, මෛත්‍රී සිතින් යුක්ත වීම ආදිය ද සීලයේ ම තවත් අංශයකි. එ බැවින් සමාජයක් සදචාර සම්පන්න වීමට පුද්ගලයන් සිල්වත් වීම අවශ්‍ය ම බව පැහැදිලි වේ.

මෙහි දී සැලකිල්ලට ගත යුතු තවත් කරුණක් ඇත. එනම් පංච සීලයෙහි පස්වන ශික්ෂාපදය සුරැකීම හා සදචාරය අතර සම්බන්ධතාවයි. සුරාවේ ආදීනව ලෙස බුදු දහම දක්වන කරුණු අතර දෙකකි, කලකෝලාහල ඇති වීම හා විළිබිය නැති වීම. කලකෝලාහල, ගැටුම් බහුල වන විට සමාජ සදචාරය පිරිහී යයි. විළිබිය නැති වූ විට ඕනෑ ම දුසිරිතක නිරත විය හැකි ය. සුරාව ඇතුළු අහිතකර ශාරීරික උත්තේජක භාවිත කරන්නා ඉතා පහසුවෙන් දුසිරිතට වැටෙන්නේ පවට ලැජ්ජාව හා බිය නැති බැවිනි; හිරි ඔතප් දෙක ඔහුගෙන් බැහැර වී ඇති බැවිනි.

> විළිබිය නැති සමාජය හෙවත් හිරි ඔතප් නැති සමාජය මනුෂ්‍ය ධර්මයෙන් පිරිහී තිරිසන් තත්ත්වයට වැටෙන බවත් ලෝකයේ සදචාරසම්පන්නකම පාලනය වන්නේ හිරි ඔත්තප්ප දෙකින් බවත් බුදුරජාණන් වහන්සේ වදළහ. හිරි නම් පව් කිරීමට ඇති ලජ්ජාව යි. එනම් මුළු හිතින් ම පව පිළිකුල් කරන ස්වභාවය යි. ඔත්තප්ප නම් පාපයට ඇති බිය යි.

හිරි ඔත්තප්ප දෙක සීලයේ පදනමයි. සීලයට ඉතා ම ළඟින් සිට උපකාර කරන්නෙත් ඒ දෙක ය. පවට ලැජ්ජාව හෝ බිය නැත්නම් සිල්වත් ජීවිතයක් ගොඩනඟා ගැනීමට පෙලඹෙන්නේ නැත; ඕනෑ ම දුසිරිතකට පහසුවෙන් ම පෙලඹේ. සිල්වත් ජීවිතයකට පෙලඹෙන්නේ හිරිඔතප් ඇති තැනැත්තා ය. මේ අනුව බලන විට හිරි ඔත්තප්ප, සීලය හා සදචාරය අතර පවතින්නේ අන්‍යෝන්‍ය සම්බන්ධයකි. හිරි ඔත්තප්ප ඇති විට පස් පවින් වැළකෙයි. පස් පවින් වැළකීම යනු සීලයේ එක් අංශයකි. එනම් විරමණයයි. මෛත්‍රිය, දයාව, අනුකම්පාව ක්‍රියාත්මක වන විට සීලයේ අනෙක් අංශය වන සමාදනය ද සම්පූර්ණ වේ.

සදචාර සම්පන්න සමාජයක සාමාජිකයන් ලෙස ජීවත් වීමට අපි කැමැත්තෙමු. එබඳු සමාජයක් ගොඩනඟා ගැනීමේ වගකීමෙන් කොටසක් අප වෙත ද පැවරී ඇත. එහි දී මූලික අවශ්‍යතාව සිල්වත් වීමයි. ඒ සඳහා අප පවින් වැළකිය යුතු ය. පව් කරන අයට කිසිදු අනුබලයක් නොදී හැකි හැම විටෙක ම ඔවුන් පාපයෙන් වළක්වාලීමට පියවර ගත යුතු ය. ඔවුන්ට පවින් වැළකීමේ ආනිශංස සහ පාපයෙහි නිරත වීමේ ආදීනව කියා දිය යුතු ය. මේ සියල්ලට ම පදනම වන්නේ පව පිළිකුල් කිරීම හා පවට බිය වීමයි. එ බැවින් හිරි ඔත්තප්ප සම්පන්න ජීවිතයක් ගොඩනඟා ගැනීමට අධිෂ්ඨානශීලී ව කටයුතු කරමු. තමාට, තමන්ගේ වයසට නො ගැළපෙන කිසිදු සදචාර විරෝධී ක්‍රියාවකට කිසිම ආකාරයකින් සම්බන්ධ නො වීමට වග බලා ගනිමු.

## සාරාංශය

සමාජයේ සාමාජිකයන් වශයෙන් සදාචාරය පිළිබඳ අපේ අවධානය යොමු කිරීම අවශ්‍ය ය. සදාචාරය නම් යහපත් හැසිරීමයි. බුදු දහමේ මේ සඳහා යෙදෙන්නේ ධම්මචරියා, සමචරියා යන වචනයි. අධම්මචරියා, විසමචරියා යනු දුරාචාරයයි. දස කුසල්හි යෙදීම ධම්මචරියාවයි. අකුසලයේ යෙදීම අධම්මචරියාවයි. පුද්ගලයන් සීලසම්පන්න වූ තරමට සමාජය සදාචාර සම්පන්න වේ. දස කුසලයෙහි සීලයේ විරමණ අංශය මෙන් ම සමාදන අංශය ද ඇත. සීලයේ පදනම හිරි ඔත්තප්ප දෙකයි. සදාචාර සම්පන්න වන්නේ හිරි ඔත්තප්ප දෙකින් යුත් පුද්ගලයන් ඇති සමාජයයි. හිරි ඔත්තප්ප සම්පන්න ජීවිතයක් ගොඩනගා ගැනීමට අප උත්සාහ දැරිය යුතු ය.


## ක්‍රියාකාරකම්



01. හිරි සහ ඔත්තප්ප යන වචන දෙකෙන් අදහස් කෙරෙන්නේ කුමක් දැයි පැහැදිලි කරන්න.


02. "සිල්වත් වීමෙන් සදාචාරවත් සමාජයක් ගොඩනැගේ" යන අදහස තහවුරු කිරීමට ඔබ දක්වන කරුණු මොනවා දැයි ලියා දක්වන්න.

## පැවරුම



සදාචාරවත් සමාජයක් ගොඩනැඟීමට අදාළ ව ආදර්ශ පාඨ 10ක්, මුළු පන්තිය ම එකතු වී පිළියෙල කර පාසල් භූමියෙහි ප්‍රදර්ශනය කරන්න. උදා: "හිරි ඔතප්වලින් යුතු ළමයි වෙමු"

## පුහුණුවට



පවට ලජ්ජා බිය
ඇති ව කුසලට යොමු වූ
සත්පුරුෂයෝ ලොවැ
දේව දහමින් සපිරුණෝ වෙති
(ජාතක පාලියෙන් සිතිවිලි සියයක් පූජ්‍ය ගන්තුනේ අස්සජි හිමි)